තලාව ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තලාව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ස්ථාවර තැන්පතු වටිනාකම රු.484,375 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබීමෙන් ජංගම නොවන ආයෝජන එම වටිනාකමින් අඩුවී තිබිණි.	ඉදිරි ගිණුම් ප්‍රකාශනවලදී නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානදෑ වල ශුද්ධ අඩුවීම රු.10,046,358 ක් විය යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමානදෑ වල ශුද්ධ වැඩිවීම රු.33,662,066 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකම රු.43,708,424 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි ගිණුම් ප්‍රකාශනවලදී නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද උසාවි දඩ ආදායම රු.15,000,000 ක් වුවද වර්ෂය සඳහා සත්‍ය වශයෙන් අයවී තිබුණු උසාවි දඩ ආදායම රු.16,331,751 ක් වූයෙන් 2024 වර්ෂය සඳහා බිල් කල ආදායම ඉක්මවා ලැබී තිබුණු රු.1,331,750 ක වටිනාකම සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් හා ඍනතා ගිණුම රු.1,331,750 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2024 වර්ෂයේදී උසාවි දඩ නොලැබුණු අතර, උපචිත පදනමට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම නිසා බිල්කල වටිනාකම වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කරන ලද බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	ප්‍රාදේශීය සභාවට අයත් පැජරෝ රථය තක්සේරු කර දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	නව තක්සේරුවක් සිදුකර, ඉදිරියේදී ගිණුම්ගත කරන බව.	සභාවට අයත් සියලුම දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	2019 වර්ෂයේ අනතුරකට භාජනය වී තිබුණු කැබ් රථය අලුත්වැඩියා නොකර පෞද්ගලික ගරාජයක ගාල් කර තිබුණ ද මීලදී ගත් පිරිවැය වූ රු.6,390,000 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ද දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.	අනතුර සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොනුකර ඇති අතර අලුත්වැඩියාවෙන් පසුව නව තක්සේරුවක් කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.

(ඊ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු ගබඩා තොග, ලිපි ද්‍රව්‍ය ගබඩා තොග, ජල කර්මාන්ත ගබඩා තොග සහ විදුලි ගබඩා තොග තක්සේරු නොකර පසුගිය වර්ෂයේ අවසන් දිනට ගිණුම්ගත කල තොග ශේෂවල එකතු වටිනාකම වූ රු.3,241,460 ක් ලෙස සමාලෝචිත වර්ෂයේදීත් ගිණුම්ගත කර තිබුණි.	භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව භෞතික තොග ශේෂයන් හදුනාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(උ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑ වල අඩුවීමෙහි වටිනාකම වූ රු.10,046,358 ක් වෙනත් ජංගම වත්කම්වල අඩුවීම ලෙස වර්ෂයේ අතිරික්තයට ගැලපීම් නොකළ යුතු වුවත් එසේ සිදුකර තිබුණි.	ඉදිරි මුල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම්ගත කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගබඩා තොග ශේෂයන් ගණනය නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වර්ෂයේ අතිරික්තය සඳහා පුස්තකාල පොත් තොගයෙහි වර්ෂය තුළ වෙනස් වීම වූ රු.597,517 ක වටිනාකම පමණක් ගැලපීම් කර තිබුණි.	භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු ශේෂ පිරික්සුම අනුව සහ උපලේඛන වාර්තා අනුව ගිණුම් විෂයයන් 08 කට අදාළව එකතු වටිනාකම රු.28,870,283 ක වෙනසක් පැවතුණි.	පිළිගන්නා බව.	අනුරූපී වාර්තා උපලේඛන සමඟ සසඳා නිවැරදි කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු LG 13 වියදම් වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ගිණුම් සටහන් අංක 08 සමඟ වියදම් විෂයයන් 06 කට අදාළව එකතු වටිනාකම රු.17,313,997 ක වෙනසක් පැවතුණි.	-එම-	-එම-
(ඇ)	සමුච්චිත අරමුදල හා ඌනතා ගිණුමෙහි 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.544,798,339 ක් වුවත් ශේෂ පිරික්සුමෙහි එදිනට එම ගිණුමෙහි ශේෂය රු.543,678,142 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,120,197 ක වෙනසක් පැවතුණි.	ඉදිරි ගිණුම් ප්‍රකාශන වලදි නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති 5 (6)	නියමිත කාල සීමාව තුලදී ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු රු.75,540,106 ක් වූ සියළු ආදායම් හා වෙනත් ගාස්තු එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සියළු ආදායම් හා වෙනත් ගාස්තු නියමිත කාල සීමාව තුලදී අය කර ගැනීමට අවශ්‍ය මෙහෙයවීම් සිදුකරන බව.	ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මු.රෙ. 571	වසර 02 ඉක්මවූ තැන්පතු වර්ග 02 කට අදාල රු. 2,386,644 ක් වටිනා තැන්පතු 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 756	2024 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වනවිට ක්‍රියාත්මකව ඇති අතර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.1,114,621 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ අයභාරය රු.22,477,373 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට ඉටුකළ යුතු මූලික අවශ්‍යතා ඉටු කිරීම, සංවර්ධන කටයුතු ඉටු කිරීම සහ පොදු සේවාවන් ඉටු කිරීම වෙනුවෙන් අවධානය යොමු නොකර සභාව විසින් ස්ථාවර තැන්පත් සහ ජංගම ගිණුම්වල 2024 දෙසැම්බර් 31 දින වන විට රු.63,562,153 ක් රඳවාගෙන තිබුණි.	එම මුදල් යොදාගෙන සංවර්ධන යෝජනා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව.	සංවර්ධන කටයුතු ඉටු කිරීම සහ පොදු සේවාවන් ඉටු කිරීම වෙනුවෙන් අවධානය යොමු කළ යුතු ය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	36,198,632	39,423,347	18,272,712	21,150,635	13,438,659	15,391,286	15,151,557	22,571,661
(ii)	කුලී	14,062,214	17,265,986	13,063,368	4,202,618	16,571,200	14,251,837	15,564,280	4,138,014
(iii)	බලපත්‍ර ගාස්තු	4,210,250	4,246,107	2,950,959	1,295,149	4,618,650	4,352,086	4,863,086	138,150
(iv)	වෙනත් ආදායම්	45,246,923	48,906,953	-	48,906,953	31,854,111	34,772,413	19,168,431	33,498,332
		99,718,019	109,842,393	34,287,039	75,555,355	66,482,620	68,767,622	54,747,354	60,346,157

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම්**		
	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් අය කිරීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවති අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.21,150,635 ක වරිපනම් හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල්කිරීම වූ රු.39,423,347 මෙන් සියයට 54 ක් විය.	හිඟයෙන් මේ වනවිට ලක්ෂ 20 ක් අයකර ඇති බවත් වාර්තා සකස් කර ඉදිරියේදී ඉදිරිපත් කරන බව.	ප්‍රවර්තන හා හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) **කුලී**

(i)	සභාව සතු වත්කම් බදු දීම සහ කුලියට ලබාදීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට අය විය යුතු වූ රු.4,202,618 ක හිඟ කුලී අයකර ගෙන නොතිබුණි.	හිඟ ආදායම් එකතු කිරීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව.	හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	වත්කම් බදු දීම වෙනුවෙන් අයවිය යුතු රු.1,436,333 ක් වසර 01 ත් - 14 ත් අතර කාලයක් ගතවී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **බලපත්‍ර ගාස්තු**

වෙළෙඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, දැන්වීම් පුවරු සහ කර්මාන්ත බදු වෙනුවෙන් අයවිය යුතු එකතු වටිනාකම රු.1,700,103 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට අය කරගෙන නොතිබුණි.	අයකර ගැනීමට නීතිමය කටයුතු ආරම්භ කරන බව.	හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඈ) **වෙනත් ආදායම්**

(i)	සභාවට අයත් තිරප්පනේ, මාවතවැව, හිරිගොල්ලාගම සහ කටියාව ජල ව්‍යාපෘතිවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ජල ගාස්තු රු.2,582,904 ක් අයකර ගෙන නොතිබුණි.	ජල ගාස්තු ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් සම්බන්ධතාවයන් විසන්ධි කළ ඒකකයන්ට විරුද්ධව නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව.	හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.40,869,972 ක් හා මුද්දර ගාස්තු රු.8,036.981 ක් අයකරගෙන නොතිබුණි.	අවස්ථා 03 කදී දන්වා යවා ඇති මුත් මෙතෙක් උසාවි දඩ එවා නොමැති අතර නැවත සිහි කැඳවීම් යවා අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ප්‍රාදේශීය සභා පිහිටුවීමෙන් හා පළාත් සභා පිහිටුවීමෙන් පසු ඉතිරි අතුරු ව්‍යාවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව.	අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු ය.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සභාවට අයත් කැබ් රථය 2019 අප්‍රේල් 15 දින අනතුරකට ලක්වී තිබුණු අතර අලාභයේ වර්තමාන තක්සේරුගත වටිනාකම රු.7,294,716 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි.	කැබ් රථයේ රියදුරුගෙන් අදාල සියයට 10 ක මුදල අයකරගෙන ඇති අතර ඉතිරි මුදල හිටපු සභාපතිතුමාගෙන් අය කිරීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව.	අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2019 ජනවාරි 31 දින අනතුරකට ලක්වී තිබුණු සභාවට අයත් ට්‍රිපර් රථය සඳහා රක්ෂණ හිමිකමෙන් ලැබෙන මුදලට අමතරව සභාව විසින් දැරූ රු.113,176 ක මුදල වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සභාව විසින් දැරූ මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකිරීමට කටයුතු ආරම්භ කරන බව.	වගකිවයුතු පාර්ශවයන් සඳහා විධිමත් විමර්ශනයක් සිදුකර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සභා ගොඩනැගිල්ලේ ඉහළ වහලය සඳහා වූ ස්ලැබ් (Slab) කොටස වැසි දිනවලදී වතුරෙන් පිරීයාම නිසා හා එම ජලය පහළ මහලට වසර ගණනාවක සිට කාන්දු වෙමින් පවතින නමුත් ඒ සඳහා පිළියම් යෙදීමට ද අවශ්‍ය කිසිදු පියවරක් බලධාරීන් ගෙන නොතිබුණු අතර එම ගොඩනැගිල්ලේ සිටින නිලධාරීන්ගේ ආරක්ෂාවට ද තර්ජනයක් වී තිබුණි.	ඉහළ මහල ඉදිකිරීම සඳහා ලබාගත් තත්වපාලන ඉංජිනේරු වාර්තාව අනුව ඉදිකිරීමට සුදුසු තත්ත්වයේ පවතින බැවින් ප්‍රාදේශීය සභා පිහිටුවීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව.	සභා ගොඩනැගිල්ල අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	වර්ෂ 2018 සිට 2023 අතර කාලයක සිට පැවත එන වැඩ අවසන් කර තිබූ කර්මාන්ත 21 කට අදාළ එකතු වටිනාකම රු.2,569,617 ක රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ වනවිට කාල විශ්ලේෂණ සිදුකරමින් සිටින අතර මෙයට අදාල විස්තර ලබාදීමට කටයුතු කරන බව.	කර්මාන්තවල අඩුපාඩු පරීක්ෂා කර රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	ප්‍රාදේශීය සභාවට අයත් එකතු වටිනාකම රු.179,206,814 ක් වූ ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් ශේෂ වෙනුවෙන් ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	තහවුරු කෙරෙන විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	වර්ෂ 2013 සිට 2022 අතර කාලයක සිට අයනොවී පවතින එකතු වටිනාකම රු.746,964 ක් වූ සේවක ණය ශේෂ 07 ක්	නීතිමය කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බව.	හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ද්විතීක මට්ටමේ තනතුරක් වූ වැඩ පරිපාලක - 111 තනතුර සඳහා සේවා ව්‍යවස්ථාවට අනුකූල නොවන පරිදි සම්මුඛ පරීක්ෂණයක් පමණක් පවත්වා ස්ථිර පත්වීම් ලබා දී තිබුණු නිලධාරියෙකු හට 2024 ජුනි 11 දින සිට 2025 අප්‍රේල් දක්වා අතර කාලය තුල එකතු වටිනාකම රු.578,204 ක වැටුප් ගෙවා තිබුණි.	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලබාදුන් පත්වීම් ලිපිය අනුව වැටුප් හා දීමනා ගෙවා ඇති බව.	සේවා ව්‍යවස්ථාවට අනුකූල වන පරිදි බඳවා ගැනීම සිදු කළ යුතුය.

3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු අක්‍රීය තත්ත්වයේ පවතින වාහන 07 ක් ප්‍රාදේශීය සභා භූමිය තුල දිරා පත්වෙමින් නිෂ්කාර්යව පැවතුණි.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වූ පසු අයිතිය සනාථ කරගෙන වෙන්දේසි කිරීමට බලපොරොත්තු වන බව.	අක්‍රීය තත්ත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.
(ආ)	රුපියල් මිලියන 09 ක් වියදම් කර 2017 වර්ෂයේදී ඉදිකර තිබුණු තඹුත්තේගම සතිපොළ ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි.	තඹුත්තේගම නගර සංවර්ධන සැලැස්ම හේතුවෙන් එය තාවකාලිකව නතර කරන ලෙස වෙළඳ හා වාණිජ කටයුතු ඇමතිතුමා විසින් වාචිකව උපදෙස් ලබාදෙන ලද බව.	නිෂ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2022 වර්ෂයේදී ඉදිකරන ලද ජංගම කඩ කාමර 08 ක් තලාව සහා පරිශ්‍රයේ ද තවත් කඩ කාමර 08 ක් තඹුත්තේගම පරිශ්‍රයේද නිෂ්කාර්යව තිබුණි.	කඩ කාමර 16 සඳහා ඉල්ලුම් කරුවන් 58 දෙනෙකු සිටින බැවින් සභාව පිහිටුවීමෙන් පසුව සුදුස්සන් තෝරා ජංගම කඩ කාමර බෙදා දීමට කටයුතු කරන බව.	නිෂ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් විශේෂ සංවර්ධන ප්‍රදාන යටතේ ඉටුකිරීමට ගිවිසුම්ගතව තිබුණු එකතු වටිනාකම රු.1,437,515 ක ව්‍යාපෘති 02 ක් ව්‍යාපෘති ඉටු කිරීමට භාරගත් සමිති විසින් ගිවිසුම් ප්‍රකාරව ඉටුනොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ප්‍රතිලාභ ලබා ගැනීම අහිමි වී තිබුණි.	කිහිප අවස්ථාවකදීම දැනුම් දුන් නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අදාල ගිවිසුම්ගත සමිති අසාදු ලේඛනයට ඇතුලත් කර ඇති බව.	ව්‍යාපෘති ඉටු කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් පමණක් තෝරා ගත යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 06 කට අදාළව නිලධාරීන් 12 කගේ අතිරික්තයක් ද තනතුරු 08 කට අදාළව නිලධාරීන් 12 කගේ ඌනතාවයක් ද පැවතුණි.	2024 අප්‍රේල් 11 වන දින ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමෙන් පසුව අතිරික්ත වී ඇති බව.	අනුමත කාර්ය මණ්ඩල සංයුතිය තුළ බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.8 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව සතු වාහන 22 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී කටයුතු කරන බව.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව හෝ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.2 පාරිසරික ගැටලු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සතුව කසළ කැබලි කිරීමේ යන්ත්‍රයක් නොමැති වීම හේතුවෙන් ඉක්මනින් දිරාපත් නොවන කසළ තොග මධ්‍යස්ථාන භූමියේ විශාල ප්‍රදේශයක අවිධිමත් ලෙස ගොඩ ගසා තිබුණි.	ප්‍රාදේශීය සභා පිහිටුවීමෙන් පසුව සභා අනුමැතිය යටතේ කසළ කැබලි කිරීමේ යන්ත්‍රයක් ලබාගැනීමට බලාපොරොත්තු වන බව.	කසළ කළමනාකරණය විධිමත්ව සිදු කළ යුතුය.
(ආ)	කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින අඩුපාඩු හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	අඩුපාඩු සකස් කර පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරන බව.	කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.